# පාතහේවාහැට පුරාවිද්‍යාත්මක උරුමය පිළිබඳ ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

(උරුමය ලිඛිත හා දෘෂ්‍යමය මාධ්‍යයෙන් වාර්තාගත කිරීම)

ටී.එච්.පී.ඒ.කේ. ජයසූරිය

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

*anushajayasooriya1@gmail.com*

**ප්‍රමුඛ පද:** පාතහේවාහැට පුරාවිද්‍යාත්මක උරුමය, උරුම විවිධතාව, උරුමයන්හි වාස්තුවිද්‍යාව

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය අතීත සමාජ සංස්කෘතිය නිරූපණය කරනු ලබන ලංකාවට ආවේණික වූ ලක්ෂ සංඛ්‍යාත පුරාවිද්‍යාත්මක උරුම පද්ධතියකින් ලංකා සමාජය සකස් වී ඇත. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජ සංස්කෘතික සන්දර්භය තුළ එම උරුමය විවිධාකරයෙන් විනාශයට පත් වෙමින් පවතී. වර්තමානයේ දී පුරාවිද්‍යාත්මක උරුමය ආරක්ෂා කර පවත්වාගෙනයාම හා අනාගතයට සම්ප්‍රේෂණය කිරීමට සංස්කෘතික සම්පත්, උරුම හා පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය යන ශික්ෂණයන් ඔස්සේ විවිධ ආයතනික හා නෛතික පදනම් ක්‍රියාත්මක වෙමින් පවතී. එහි දී සංස්කෘතික උරුමය හඳුනාගැනීම, ලේඛනගතකිරීම, ආරක්ෂා කිරීම, සංරක්ෂණය කිරීම, අර්ථකතනය කිරීම හා ඉදිරිපත් කිරීම යනාදී ක්‍රියාවලීන් විවිධ මැදිහත්වීම් අනුව විද්‍යාත්මකව ක්‍රියාත්මක කරන අතර ඒ අතරින් උරුමය විධිමත්ව හා නිවැරදිව වාර්තාගකිරීම (ලේඛනගතකිරීම) මූලික පියවරක් වනවා සේම වැදගත්ම කාර්යයක් ද වේ.

ශ්‍රී ලාංකේය ඉතිහාසයේ අවසාන රාජධානිය වූයේ සෙංකඩගලපුරය අගනගරය කර ගත් කන්ද උඩරට රාජධානිය හෙවත් කන්ද උඩ පස් රට යි. ප්‍රාදේශීය පරිපාලන රටාවක් යටතේ පැවති රාජධානියේ සීමාවන්ට අනුකූල අදාල ප්‍රදේශය දිසා 12ක් ද රටවල් 5ක් ද (පසුව මෙම රටවල් 9ක් දක්වා වැඩි වී ඇත) වන ලෙස බෙදා තිබූ බව සඳහන් වේ. දුම්බර, හාරිස්පත්තුව, උඩුනුවර, යටිනුවර හා හේවාහැට යන රටවල් කන්දඋඩ පස්රටට අයත් විය. හේවාහැට රට මාඔය පදනම් කරගනිමින් එගොඩතිහ (පාතහේවාහැට) හා මෙගොඩතිහ (උඩහේවාහැට) ලෙසින් පරිපාලන ඒකක දෙකකට බෙදා තිබූ බව පැහැදිලි වේ. එගොඩතිහ හෙවත් පාතහේවාහැට පර්යේෂණ කලාපය වශයෙන් පාදක කරගනිමින් එම කලාපයේ ඓතිහාසිකත්වය, භූගෝලීය හා භූ විද්‍යාත්මක පසුබිම, කලාපයේ පවතින පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, ආගමික, වාස්තු විද්‍යාත්මක, දේශපාලනික හා කලාත්මක වැදගත්කමකින් යුක්තවන ඉදකිරිම් හා මහනුවර රාජධානි සමයේ විවිධ දේශපාලනික සිදුවීම් සිදු වූ භූමි ප්‍රදේශ පිළිබඳව ප්‍රදේශය ආශ්‍රිත ස්මාරක, ජනකවි, ජනකතා හා අනෙකුත් ලේඛනගතමය මලාශ්‍ර, සෙල්ලිපි ආදිය පාදක කරගනිමින් පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික අධ්‍යයනයක් කර එම

ස්මාරක ලිඛිත හා දෘෂ්‍යමය මාධ්‍යයෙන් වාර්තාගතකිරීම අපේක්ෂා කරනු ලැබේ.

**ක්‍රමවේදය**

පර්යේෂණ කලාපය නිවැරදිව හඳුනාගනිමින් එහි උරුමය හඳුනාගෙන වාර්තාගතකිරීම දක්වා දත්ත හඳුනා ගැනීමට, දත්ත රැස් කිරීමට, වාර්තාගතකිරීමට, විශ්ලේෂණයට හා ඉදිරිපත් කිරීම සඳහා මූලාශ්‍ර පරිශීලනය, ක්ෂේත්‍ර අධ්‍යයනය, සම්මුඛ සාකච්ඡා පවත්වමින් පවතින පුරාවිද්‍යාත්මක උරුමයන්ගේ ස්වභාවය හා විවිධතාව අනුව උරුමය වර්ගීකරණය කර එවායේ ඡායාරූප, සැළසුම් හා සිතියම් යොදා ගනිමින් සැළසුම්කරණය, ඡායාරූපකරණය හා විස්තරකරණය යන වාර්තාගතකරණ ක්‍රමවේදයන් භාවිත කරමින් උරුමය වාර්තාගතකිරීම හා එම දත්ත විශ්ලේෂණය කර ඉදිරිපත්කිරීම කරන ලදි.

**ප්‍රතිඵල සහ සාකච්ඡා**

පාතහේවාහැට පුරාවිද්‍යාත්මක උරුමය ඒවායේ නිර්මිත මාධ්‍යය, කාලය, සමාජ උපයෝගීතාව හා වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අනුව යම් විවිධතාවක් යටතේ පවතින බව පැහැදිලි වේ. මේ අනුව කලාපය පුරාවට කරන ලද ක්ෂේත්‍ර අධ්‍යයනයේ දී ශිලාමය හා දැවමය අම්බලම් 10ක් ද, ධර්මශාලා 10ක් ද, රජමහ විහාර 6ක්, ප්‍රභූ නිවාස හෙවත් වලව් 3ක් හා වතු බංගලා 3ක් මෙන්ම වෙනත් විවිධ උරුමයන් (දේවාල, පිහිලි, සෙල්ලිපි, ගල් ලෙන්) විශාල ප්‍රමාණයක් හා කටාරම් සහිත හා රහිත ස්වභාවික ගල් ලෙන් හා ලෙන් සංකීර්ණ හඳුනාගතහැකි විය.

පාතහේවාහැට ප්‍රදේශයේ පවතින අම්බලම් ප්‍රධාන වශයෙන් ගල් බෝල මත හා ගල් පාදම් මත පෝරු (අට්ටාල) දෙකක් හා තනි පෝරුවක්වන පරිදි කැණිමඩලකින් සමන්විතව එක සමාන වාස්තුවිද්‍යාත්මක සැළසුමක් මත ඉදි කර ඇති අතර ඒ සඳහා බහුලව දැව මාධ්‍ය හා ශිලා මාධ්‍යය භාවිත කර ඇත. ඒ මගින් මහනුවර අවධියේ දැව කැටයම් කලාවේ හා වාස්තුවිද්‍යාවේ ලක්ෂණ මැනවින් නිරූපණය කරනු ලබයි. මාරස්සන වෙල මැද අම්බලම, පුරාණ කන්දෙවෙල හා ගොඩමුන්න යන අම්බලම් මෙහිලා සුවිශේෂී වේ.

පාතහේවාහැට ප්‍රදේශයේ පවතින ධර්මශාලා හෙවත් බණමඩු හා රජමහ විහාර තුළින් කලාපයේ ආගමික තත්වය පිළිඹිබු වනවා සේම ධර්මශාලා ඉදි කිරීමේ දී කලාපයේ පවතින භූ දර්ශනය අනුව සෑම විටම උස් ස්ථානයක කලාපයේ රජමහ විහාර හා අනෙකුත් ආගමික මධ්‍යස්ථානයන්ගෙන් පහසුවෙන් වෙන් කර හඳුනාගත හැකි අයුරින් එක හා සමාන වාස්තු විද්‍යාත්මක සැළසුමක් හා ආකෘතියක් අනුව ඉදි කර ඇති බව පැහැදිලි වේ. එනම් ධර්මශාලාවල බාහිරින් වහලය මහල් 03ක් වන ලෙසින් හා ශාලාව අභ්‍යන්තරයේ වේදිකා හෙවත් උසමට්ටම් 3ක් වන පරිදි නිර්මාණය කර ඇත. කලාපයේ ධර්මශාලා අභ්‍යන්තරය මෙලෙස මට්ටම් 3ක් වන ලෙසින් හා අම්බලම් පෝරු 2ක් වන පරිදි ඉදි කර තිබීමෙන් සමකාලීන සමාජයේ කුල ක්‍රමය මැනවින් නිරූපණය වේ. අම්බලම්වල පිටත පෝරුව කුල හීනයන්ටත් ඇතුල් පෝරුව කුලීනයන්ටත් ධර්මශාලාවල පහළම වේදිකාව කුල හීනයන්ටත් දෙවන වේදිකාව කුලීනයන්ටත් උඩමණ්ඩප්පය භික්ෂූන්ටත් වෙන්ව පැවති බව කලාපයේ ජන සාහිත්‍ය අනුව පැහැදිලි විය. රජමහ විහාර තුළින් සමකාලීන සිතුවම් කලාවේ ලක්ෂණ ද හඳුනා ගතහැකි ය.

කලාපීය ඓතිහාසිකත්වය තහවුරු කරනු ලබන විවිධ කාලවලට අයත් බෝපිටිය, අම්පිටිය, හාරගම හා සගම යන සෙල්ලිපි ද මෙහිලා ප්‍රධාන වේ. කලාපයේ විවිධ ස්ථානවල ගල්තලාවන් මත කරන ලද

විවිධ සංකේත ද ඇතැම්විට පෙර පැවති කඩයිම් ලකුණු විය හැකි බව හඳුනාගත හැකිවිය. කලාපය තුළ ඇති ස්වභාවික ගල්ගුහා ක්ෂේත්‍ර පිළිබඳව ද විධිමත් අධ්‍යයනයක් සිදුකිරීම මගින් කලාපයේ ඉතිහාසය තවදුරටත් දීර්ඝ වියහැකි බව පැහැදිලි වේ.

විධිමත් භූගෝලීය බෙදීමකට වඩා ඓතිහාසික පරිපාලනමය බෙදීමත් යටතේ කඳුකර හා මද බෑවුම් භූ දර්ශනයකින් යුත් ස්වභාවික ජල මූලාශ්‍ර, පාෂාණ හා ඛනිජ ව්‍යාප්තියක් පවතින තෙත් හා වියළි දේශගුණික ලක්ෂණවලින් සමන්විත ආරක්ෂිත භූමි ප්‍රදේශයක් වන පාතහේවාහැට ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක උරුමයන් ඒවායේ සමාජ උපයෝගීතාව, කාර්යය, ආකෘතිය, නිර්මිත කාලය හා මාධ්‍යය ආදී ලක්ෂණ අනුව යම් විවිධතාවයක් නිරූපණය කරනු ලබන බව නිගමනය කළහැකි ය. කලාපීය පුරාවිද්‍යාත්මක උරුමයන් අතරින් බහුතරයක් උරුමයන් නිශ්චිතවම කාලනීර්ණය කිරීමට අසීරු වුව ද එම නිර්මාණවල කලාත්මක අංග (චිත්‍ර, මූර්ති හා කැටයම්), වාස්තුවිද්‍යාත්මක සැලසුම්, ආකෘති, පැරණි සමාජ උපයෝගීතාව අනුව සාපේක්ෂ වශයෙන් උරුමයන් අතරින් බහුතරයක් උරුමයන් ගම්පළ හා මහනුවර සමයට අයත් වන බව කාලනීර්ණය කළ හැකිවිය. සමස්ථ උරුමය සමකාලීන සමාජයේ පැවති සමාජ, ආර්ථික, දේශපාලනික, ආගමික, කලාත්මක හා සංස්කෘතික විවිධත්වයට අනුගතව නිර්මාණය කර ඇති නිසාවෙන් කලාපීය පුරාවිද්‍යාත්මක උරුමය සමකාලීන සමාජ ක්‍රමය අධ්‍යයනය කිරීමේ දී පාදක කරගත හැකි වැදගත් පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර විශේෂයක් ලෙසින් දැක්විය හැකි ය. පාතහේවාහැට ප්‍රදේශය ලාංකේය ප්‍රාග්ඓතිහාසික අවධියේ දී මානව ජනාවාසකරණය වෙමින් ඓතිහාසික අවධියේ පටන් ක්‍රමානුකූලව දේශපාලනික හා සංස්කෘතික වශයෙන් වැදගත් වන්නට ඇති ප්‍රදේශයක් වියහැකි බව ත් එහි පැවති සමකාලීන සමාජ අර්ථ ක්‍රමයේ ලක්ෂණ නිරූපණය කරනු ලබන පුරාවිද්‍යාත්මක උරුම පද්ධතියකින් සමන්විතවන ඓතිහාසික හා පුරාවිද්‍යාත්මකව වැදගත්වන කලාපයක් ලෙසින් ද නිගමනය කළහැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


දසනායක රෝහිත (2000) ***අම්බලම සහ සමාජය.*** ආරිය ප්‍රකාශකයෝ, වරකපොල.

දිසානායක සෙනරත් බණ්ඩාර (1997) ***දියතිලක නුවර පැරණි ස්මාරක ස්ථාන.*** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

වරසම්බෝධි පණ්ඩිත ගුණාලංකාර මහ ස්ථවිර (1948) ***ගම්පළ ඉතිහාසය.*** ලේක්හවුස් මුද්‍රණාලය.

Lawrie A.C. (1886) ***A Gazetteer of the central province of Ceylon Vol I and Vol II.*** Colombo.